## ධීවර අමාත්‍යාංශය

## පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය

# නඩත්තු නිලධාරී සහ ජලනළ කාර්මික තනතුරු සඳහා බඳවා ගැනීම

ධීවර අමාත්‍යාංශය යටතේ කළමනාකරණ භාරයක් මගින් පාලනය වන පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පුරප්පාඩුව පවතින "**කණිෂ්ඨ කළමනාකාර**" (JM 1-2) සේවා ශ්‍රේණියේ තනතුරක් වන "**නඩත්තු නිලධාරී**" තනතුර සහ ප්‍රාථමික - ශිල්පීය (PL-3) සේවා ශ්‍රේණියේ තනතුරක් වන "ජලනළ කාර්මික" තනතුරු සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. "නඩත්තු නිලධාරී" (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු (සිවිල්) උපාධියක් ලබා තිබීම.

හෝ

02. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් සිවිල් / යාන්ත්‍රික / විදුලි ඉංජිනේරු යන විෂයන් ඇතුළත්ව ලබාගන්නා ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගන්නා ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

04. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගන්නා ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස**

අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ දීමනා**

JM 1-2 රු. (43,355-10x755-18x1,135 = 71,335)

## 02. ජලනළ කාර්මික (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 01)

**අධ්‍යාපන සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

සහ

ජලනළ කාර්මික ශිල්පය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (4) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා ජලනළ කාර්මික ශිල්පය පිළිබඳ වසර 03 ක සේවා පළපුරුද්දක් තිබීම.

**වයස**

අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ දීමනා**

PL 3 රු. (26,290-10x270-10x300-10x330-12x350 = 39,490/-)

**03. අයදුම්පත් එවිය යුතු ආකාරය**

අයදුම්කරුවන් විසින් සකස් කර ගන්නා ලද අදාළ සියලු තොරතුරු ඇතුළත් අයදුම්පත් 2021.04.27 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති,**
**පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය,**
**පරිපාලන කාර්යාලය,**
**මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය,**
**පෑලියගොඩ.**

අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරෙහි "පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ නඩත්තු නිලධාරී තනතුරට / ජලනළ කාර්මික තනතුරට (අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය) බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතු වේ.

නියමිත දින පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතුය. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. ඉහත පුරප්පාඩුව සම්පූර්ණයෙන් පිරවීම හෝ නොපිරවීම පිළිබඳ පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ තීරණය අවසන් තීරණය වේ.

**සභාපති,**
**පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය,**
**පරිපාලන කාර්යාලය,**
**මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය, පෑලියගොඩ.**
**2021.04.01**

Source: Dinamina (2021.04.01)